# වනාන්තර මත පදනම් වූ කාබන් තිර කිරීමේ පිරිවැය.



හැඳින්වීම

අප ජීවත් වන්නාවූ පෘථිවිය සත්‍යය වශයෙන් පැවතිය යුතු උෂ්ණත්වයට වඩා උණුසුම්ව පවත්වා ගැනීම සඳහා උපකාරීවන පෘථිවි වායුගෝලය කාබන් ඩයොක්සයිඩ් ($Co_2$) සහ අනෙකුත් හරිතාගාර වායු ($GHG_S$) නිසා ආරක්ෂිත ස්ථරයක් මෙන් ක්‍රියා කරයි. මෙම තාපය රඳවා ගැනීම ජීවී වාසයට සුදුසු උෂ්ණත්වයක් පවත්වා ගැනීම සඳහා තීරණාත්මක වේ. යම් හෙයකින් වායුගෝලය තුල $Co_2$ ප්‍රමාණය සැලකිය යුතු ප්‍රමාණයකින් අඩු වුවහොත් ගෝලීය උෂ්ණත්වය අඩුවන අතර පරිසර පද්ධති සහ මානව සමාජය ඒ අනුව හැඩගැසේ. එසේම වායුගෝලීය $Co_2$ ප්‍රමාණය ඉහල ගියහොත් ගෝලීය උෂ්ණත්වය වැඩිවී සූර්ය විකිරණ හරිතාගාර තුළ රැඳීම සිදුවේ. වායුගෝලය තුල $Co_2$ සාන්ද්‍රණය වායුගෝලීය කාබන් සංචිත අතර සිදුවන අඛණ්ඩ ගැලීම මත තීරණය වේ. එනම් සාගරය පෘථිවි ජෛව ගෝලීය පද්ධතිය හා එහි භූ විද්‍යාත්මක ද්‍රව්‍යයන්ය. (රූපය 1)


වායුගෝලයට ගලන කාබන් ප්‍රමාණය සහ ඉන් පිටවන ප්‍රමාණය (ශාක ද්‍රව්‍යන් සහ ද්‍රව්‍යමය කාබන්) සමතුලිතව පවතින තෙක් වායුගෝලය තුළ පවතින කාබන් ප්‍රමාණය ස්ථාවරව පවතී.

විශේෂයෙන් පොසිල ඉන්ධන ලබාගැනීම හා දහනය කිරීම , වනාන්තර විනාශ කිරීම හා අඩු කිරීම, වායුගෝලය තුල හරිතාගාර වායුන්ගේ ප්‍රමාණය (මූලිකවම $Co_2$) ඉහළ යාමට හේතු වී ඇති බවයි. පර්යේෂණ දත්තයන් අනුව දැනට වායුගෝලයේ කාබන් සෙමෙන් එහෙත් ඒකාකාරීව වැඩිවීමට බලපාන මූලික ප්‍රභවයක් ලෙස පොසිල ඉන්ධන දහනය හා භූමි භාවිතයේදී සිදු කරන වෙනස්කම් දැක්විය හැක. මෙමගින් පොසිල ඉන්ධන දහනයෙන් ආසන්න ලෙස කාබන් ගිගාටොන් 5.5 (බිලියන මෙට්‍රික් ටොන්) ක් සහ භූමි භාවිතය නිසා කාබන් ගිගා ටොන් 1.1ක් පමණ වසරකදී වායුගෝලයට එක්වේ.

සාගර මගින් ආසන්න වශයෙන් වාර්ෂිකව වායුගෝලයෙන් කාබන් ගිගා ටොන් 2ක් පමණ

රූපය 1 : ගෝලීය කාබන් චක්‍රය (කාබන් ගිගා වොට් වශයෙන් දක්වා ඇත.)

**The Global Carbon Cycle** (in G+ C)





අවශෝෂණය කරගනු ලැබේ. එය සාගර මගින් වායුගෝලයට නිකුත් කරන කාබන් ප්‍රමාණයට වඩා වැඩි අගයක් වන අතර පෘතුවියේ ජෛව පද්ධති මගින් තවත් කාබන් ගිගා ටොන් 1.2ක් පමණ වාර්ෂිකව එක් රැස් කර ගනී. මේ සියල්ල සලකා බැලුවිට වායුගෝලය විසින් කාබන් නිදහස් කරන ප්‍රමාණයට වඩා වාර්ෂිකව ආසන්න වශයෙන් කාබන් ගිගා ටොන් 3.4 ක් පමණ අවශෝෂණය කර ගනී.

වායුගෝලය තුළ ගබඩා වී ඇති මුළු කාබන් ප්‍රමාණය (ගිගාටොන් 750) සමඟ සලකා බැලුවිට, මෙම වාර්ෂික ශුද්ධ වැඩි වීම එතරම් විශාල අගයක් නොවේ. (වාර්ෂිකව එය මුළු සංචිත කාබන් ප්‍රමාණයට එකතු වේ.) උදාහරණයක් වශයෙන් වර්තමාන වායුගෝලීය කාබන් එක්රැස් වීම නියතව පැවතියහොත් වසර 50 කදී එම වැඩිවීම වායුගෝලීය කාබන් ප්‍රමාණයෙන් සියයට 25ක් පමණ විය හැක. කෙසේ වෙතත් වායුගෝලීය කාබන් ප්‍රමාණය වැඩිවීමට බලපාන මානව ක්‍රියාකාරකම් වල වේගය ක්‍රමයෙන් වැඩිමේන් පවතී.

ගෝලීය දේශගුණ වෙනස්වීමේ තර්ජනය පිළිබඳ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමේ පිරිවැය.

ආවස්ථික පිරිවැය (Opportunity Cost) මඟින් අදහස් කරන්නේ යම් දෙයක් ලබාගැනීම සඳහා කුමක් කැප කළ යුතුද යන්නයි. එය ඍණාත්මක පාරිසරික බලපෑම් නැවැත්වීමට හෝ ඒ සඳහා ඇති අවස්ථාවන් අඩුකිරීම සඳහා කැපකරන කුමන හෝ දෙයක වටිනාකමේ මිනුමක් ලෙස දැක්විය හැකිය. ආවස්ථික පිරිවැය නියම වශයෙන් මුදල් වියදම් සමඟ එක හා සමාන නොවේ. එනම් පාරිසරික දියුණුවක් ඇති කිරීම සඳහා අවශ්‍ය සම්පත්වල මිල එම සම්පත් වල ආවස්ථික පිරිවැය වශයෙන් දැක්වීම නිවැරදි නොවීමයි. මේ නිසා දේශගුණ ප්‍රතිපත්තියක පිරිවැය සමාන වනුයේ එම ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමට අවශ්‍යය දුර්ලභ සම්පත් ඒවායේ වඩා හොඳ ඊළඟ භාවිතයට යෙදවීමට වඩා එම දේශගුණ ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා යෙදවීම මඟින් නිසැක වශයෙන්ම ලැබෙන සමාජීය ප්‍රතිලාභ වලටය. පිරිවැය සහ ප්‍රතිලාභ එකම කාසියක දෙපැත්ත වැනිය. පාරිසරික ආරක්ෂණ වැඩපිළිවෙලක පිරිවැය මිල හෝ ආදායම් වෙනස්කම් සමඟ ඇති වන සමාජීය ප්‍රතිලාභවල දළ පහල වැටීම (පාරිභෝගික සහ නිෂ්පාදන අතිරික්තයන්) වශයෙන්ද අර්ථකථනය කළ හැක. කිසියම් ප්‍රතිපත්තිමය ක්‍රියාත්මක කිරීමක් නිසා පාරිසරික ප්‍රතිලාභ නිර්මාණය වන අතර ඒ සමඟ අනෙකුත් ප්‍රතිලාභ ද නිසැක වශයෙන් ඇතිවේ.

අනෙක් පිරිවැයක් නම් හිතකර ප්‍රතිඵලයන්ය. මෙය ඇතැම් විට පාරිසරික නිමයන් වල "ඍණ පිරිවැය" ලෙසද හඳුන්වයි. පිරිවැය ස්ථරයන්හි තවත් එක් වැදගත් කරුණක් වනුයේ පොදු සමතුලිතතාවය හෙවත් බහු වෙළඳපොළ (Muliti Market) බලපෑම් අයෝජනයන් අධෛර්යමත් කිරීම සහ නව සොයා ගැනීම් අඩපණ තත්ත්වයට පත්කිරීම හා සම්බන්ධ වීමයි. එනම් සැබෑ ලෝකයේ ආර්ථිකයන්හි සංක්‍රමණික පිරිවැයන් කාලයත් සමඟ සිදුවන නියම වෙනස්වීම් වලට ප්‍රතිචාර දැක්වීමයි. උදාහරණයක් වශයෙන් කිසියම් කර්මාන්ත ශාලාවක් නව නීතියක් නිසා ඉතා අධික වියදම් සහිත පරිසර දූෂණ උපකරණ සවිකිරීම වෙනුවට එහි හිමිකරුවන් කර්මාන්ත ශාලාව වසා දැමීමට තීරණය කිරීම. මෙය පටු පිරිවැය ඇස්තමේන්තු වලදී ශූන්‍ය පිරිවැයක් ලෙස ගණනය කළද එය සත්‍ය වශයෙන් විශාල සමාජ පිරිවැයකි. මේ නිසා සත්‍ය වශයෙන් දේශගුණ විපර්යාස ප්‍රතිපත්තිවල පොදු සමතුලිත පිරිවැය (සහ දේශගුණ විපර්යාස වලින් සිදු වූ හානිවල පොදු සමතුලිතතාවය) පාරිභෝගිකයින් සහ නිෂ්පාදකයන් තමන් මිලදී ගන්නා සහ විකුණන භාණ්ඩ සහ සේවාවන් වල පරස්පර මිල වෙනස්වීම් වලදී කොතෙක් දුරට වෙනත් නව ආදේශක භාණ්ඩ හා සේවාවන් සඳහා යොමු විය හැකි දැයි විදහා පෙන්වයි.

පරිසර ආරක්ෂණය සඳහා ඉහල තත්ත්වයේ පිරිවැය ඇස්තමේන්තු සකස් කිරීමේදී ඉතාමත් සැලකිලිමත්වීම අත්‍යාවශ්‍යය. සංකල්පනාත්මකව මේ සඳහා අදියර 4 ක් දැක් වේ.

1. පළමුවෙන්ම යොදා ගැනීමට බලාපොරොත්තු වන ප්‍රතිපත්තිමය මෙවලම හඳුනා ගත යුතුය. උදා: සාම්ප්‍රදායික මෙවලම් (තාක්ෂණික තත්ත්වයන්) හෝ වෙළඳ පොළ මත පදනම් වූ ආර්ථික මෙවලම් (විමෝචන ගාස්තු) ක්‍රියාත්මක කරන්නේද යන වග මෙය වැදගත් වනුයේ සමාන පාරිසරික අරමුණු (උදා: $Co_2$ විමෝචනය තීරණය කර ඇති

ප්‍රමාණයකින් අඩු කිරීම) ළඟා කර ගැනීමට යාමේදී ඒ සඳහා යොදා ගන්නා ප්‍රතිපත්ති මෙවලම අනුව මුළු පිරිවැය ප්‍රමාණය වෙනස් වන නිසාය.

2. දෙවැන්න එම හඳුනා ගත් ප්‍රතිපත්ති මෙවලම ක්‍රියාවේ යෙදවීම සඳහා විශේෂිත වූ ක්‍රියාකාරකම් හඳුනා ගැනීමයි. ඇතැම් විට මෙම ක්‍රියාමාර්ගයන් නව උපකරණ කොටසක් තෝරා ගැනීම විය හැකිය. නැතිනම් සිදුකරන වෙනස් කිරීමක්ද විය හැක.

3. තෙවැන්න, හඳුනා ගත් ක්‍රියාකාරකම් වෙනුවෙන් වූ සත්‍ය පිරිවැය ගණනය කිරීම.

4. හතරවැන්න නම් අදාල කාල රාමුවක් තුළ මෙම සියළු පිරිවැයන්ගේ එකතුව සමාජයද ඇතුලත් වන අයුරින් ගණනය කිරීමයි.

දේශගුණ වෙනස්වීම් ප්‍රතිපත්ති වලදී පිරිවැය ගණනය කිරීමේ ක්‍රියාමාර්ගයන්ට ඇතුලත් වනුයේ,

1. පාලන ක්‍රියාමාර්ගයන් සඳහා වන ඍජු මුදල්මය පිරිවැයක් (උදා: වැඩි කාබන් ප්‍රමාණයක් ජනනය වන ගල් අඟුරු ශක්ති උත්පාදනය වෙනුවට ස්වභාවික ගෑස් යොදා ගැනීම මඟින් බලශක්ති ජනනය සඳහා වන වර්ධන පිරිවැය (incremental cost)

2. නිෂ්පාදකයින් සහ පාරිභෝගිකයන් නව බාධකවලට හැඩ ගැසෙන විට ඇති වන පිරිවැය (උදා: ස්ථාවර ප්‍රාග්ධනයෙහි සිදුවන වේගවත් ක්ෂය වීම)

**දේශගුණ වෙනස්වීම් අඩුකිරීමේ පිරිවැය ඇස්තමේන්තු කරුණු කිහිපයක් මත පදනම් වේ. ඒවා නම්,**

1. හරිතාගාර වායු විමෝචන සහ කාබන් තිර කිරීම පිළිබඳ මූලික උපකල්පනයන්

2. විශ්ලේෂණය කළ ප්‍රතිපත්ති ආධිපත්‍යයන්හි ලක්ෂණ හා ඒවා කොතෙක් දුරට නම්‍යශීලී වන්නේ ද යන වග

3. විශේෂණය සඳහා විය හැකි තාක්ෂණික වෙනස්කම් කෙසේ ඇතුලත් කර ඇති ද යන්න

4. මිල වෙනස්වීම් වලදී නිෂ්පාදකයින්ට සහ පාරිභෝගිකයින්ට කොතෙක් දුරට ආදේශක භාවිතා කළ හැකි ද යන්න.

කාබන් තිර කිරීම පිළිබඳ පිරිවැය ඇස්තමේන්තු සඳහා බලපාන කරුණු.

කාබන් තිර කිරීමේ පිරිවැය, තිර කරනු ලබන කාබන් ටොන් එකකට මුදල් ප්‍රමාණයක් (ඩොලර්) ලෙස ප්‍රකාශ කරනු ලබයි. එනම් එක් විශේෂිත වැඩ සටහනක් සඳහා ආර්ථිකමය ප්‍රධානයන්ට ලැබෙන කාබන් තිර කිරීමේ ප්‍රතිධානයන්ගේ අනුපාතයයි. මෙහිදී ලවය වන තිර කළ කාබන් තීරණය කරනු ලබන්නේ, වන කළමනාකරණ ක්‍රියාමාර්ගයන් ශාක විශේෂ, භූගෝලීය ස්ථාන හා ලක්ෂණයන් සහ කල්පිත ප්‍රතිපත්තියක හෝ වැඩ සටහනක ඇතුලත් නිෂ්පාදන වල තැන්පත් වීමයි.

හරය නියෝජනය කරන්නේ එකතු කළ භූමි පිරිවැය, සිටුවීම හා කළමනාකරණය සහ ඇතැම් විට ද්විතීය පිරිවැය හෝ ප්‍රතිලාභ එනම්, දේශගුණිකමය නොවන පාරිසරික බලපෑම් හෝ දැව නිෂ්පාදනයන්ය.

ඉතා හොඳින් දියුණු කරන ලද සමීකරණයක භූමි මාරුකිරීම් වගාවන් ස්ථාපනය හා නඩත්තු කිරීම යන පිරිවැයන්ද ඇතුලත් වන අතර ඉඩම් හිමිකරුවන්ගේ අදාල ආවස්ථික පිරිවැය පිළිබඳ තීක්ෂණ ඥාණය ද ඇතුලත් වන්නේය. භූමි පිරිවැය සඳහා එහි විකල්ප භාවිතයන් පිළිබඳ ආවස්ථික පිරිවැය ඇතුළත් වේ.

මේ අනුව කාබන් තිර කිරීම පිළිබඳ පිරිවැය ඇස්තමේන්තු සඳහා බලපාන කරුණු වනුයේ,

1. ජීව විද්‍යාව: ශාක විශේෂ, වන ක්‍රියාකාරකම් සහ (කාබන් ) අස්වනු නෙලීමේ ක්‍රියාකාරකම්.

ඇමරිකා එක්සත් ජනපදය සැලකූ විට කෘෂිකාර්මික හා වන භූමිවල කාබන් තිර කිරීමේ ශ්‍රීඝ්‍රතාවය සඳහා විවිධ ක්‍රියාකාරකම් බලපායි. වන භූමියක කාබන් තිර කිරීම වැඩි කිරීමට බලපාන වන ක්‍රියාකාරකම් වනුයේ,


1. කෘෂිකාර්මික බිම් කැළෑ බව පත් කිරීම.

2. දැව අස්වනු නෙළා ගත් හෝ පිළිස්සු භූමි වල නැවත වන වගා කිරීම.

3. කාබන් ගබඩා කිරීම අවධාරණය කිරීම වැදගත් වන වගා කළමනාකරණ ක්‍රියාකාරකම් වල වැඩි දියුණු කිරීම්.

4. බාහිර පරිසරයට කාබන් නිදහස් කිරීම අඩු





කරන අඩු බලපෑම් සහිත දැව අස්වනු නෙලීමේ ක්‍රම සඳහා හැඩ ගැසීම.

5. වනාන්තරවල ශෂ්‍ය මාරු චක්‍ර දීර්ඝ කිරීම.

6. වෙනත් කටයුතු සඳහා පරිවර්ථනයන්ගෙන් වනාන්තර ආරක්‍ෂා කිරීම.

7.වනාන්තර ආශ්‍රිත කෘෂිකාර්මික ක්‍රියාකාරකම් සඳහා හැඩ ගැසීම.

8. කෙටි කාලීන දැවමය වන වගා ශෂ්‍ය මාරු ක්‍රම ස්ථාපනය කිරීම.

9. නාගරික වන උයන් පිළිබඳ ක්‍රියාකාරකම්


ඉහත අංක 1 හා 2 වැව්ලි ක්‍රම වලට අයත් ලක්‍ෂණ පෙන්වයි. 3 සහ 4 දැනට පවතින වන භූමි වල වන කළමනාකරණ ක්‍රියාකාරකම් වල සිදු කරන අත්‍යාවශ්‍ය වැඩි දියුණු කිරීම ලෙස දැක්විය හැක.

වන ආශ්‍රිත කෘෂිකර්මය යනු වැඩි ප්‍රතිලාභ ජනනය කිරීම සඳහා වන නිෂ්පාදන හා කෘෂි නිෂ්පාදන ඒකාබද්ධව සිදු කිරීමය. උදාහරණයක් වශයෙන් කාබන් විමෝචන අඩු කිරීම සඳහා පොසිල ඉන්ධන විතැන් කිරීම කෙටි කාලීන ශෂ්‍ය මාරු වැව්ලි ලෙස ජෛව ස්කන්ධ වගා කිරීම දැක්විය හැක. අවසාන වශයෙන් නාගරික ප්‍රදේශවල කාබන් තිර කිරීම වැඩි කිරීම සඳහා වැඩි අවකාශයක් නිර්මාණය කරමින් වායු සමීකරණ වැනි දේ සඳහා වැය වන ශක්තිය අඩු කිරීම නාගරික වන උයන් මගින් බලාපොරොත්තු වේ.

එසේම වනාන්තරයක කාබන් තිර කිරීමේ ශ්‍රීඝ්‍රතාවය එහි භාවිතා වන කළමනාකරණ ක්‍රියාකාරකම් අඩංගු ශාක විශේෂයන් සහ ආවරණය වන භූගෝලීය ප්‍රදේශය අනුවද යැපේ. මෙය ඇමරිකා එක්සත් ජනපදය හා සම්බන්ධ පහත 2 රූප සටහනෙන් පැහැදිලි වේ.

වනාන්තර පරිසර පද්ධතියක කාබන් ගබඩා කරන විවිධ කොටස් නම්, ශාක කඳන්, අතු කොළ, රලු හා සිනිඳු මුල්, පස, දිරාපත් වන ද්‍රව්‍ය සහ යටි ස්ථර ආදියයි.

රූප සටහන 2



**2** භූමියේ ආවස්ථික පිරිවැය

කාබන් තිර කිරීමේ පිරිවැය සම්බන්ධ මෙතෙක් සිදුකර ඇති අධ්‍යයන වල දී( භූමියේ ආවස්ථික පිරිවැය සැලකිල්ලට ගෙන සිදු කරන ලද අධ්‍යයනයන්හි දී ) කාබන් තිර කිරීමේ පිරිවැය ඇස්තමේන්තු එසේ යොදා නොගත් අධ්‍යයන වල පිරිවැය ඇස්තමේන්තු වලට වඩා 2 සිට 3.5 අතර ගුණයකින් වැඩි බව සොයා ගෙන ඇත.

මෙම ආවස්ථික පිරිවැය ගණනය කිරීමේදී ප්‍රධාන වශයෙන් සලකා බලනුයේ සලකනු ලබන භූමිය කාබන් සංචිතයක් වශයෙන් ස්ථාපනය කිරීම වෙනුවට එය වෙනත් භාවිතයන් සඳහා යොදා ගත හොත් ඇතිවන ශුද්ධ ආර්ථික ප්‍රතිලාභය කොපමණද යන්නයි.

3 වන කළමනාකරණය : ආරම්භක පිරිවැය හා නඩත්තු පිරිවැය

ආරම්භක පිරිවැය හා නඩත්තු පිරිවැය මුළු කාබන් තිර කිරීමේ පිරිවැය වැඩසටහන සඳහාම දායකත්වය සපයයි. මෙහිදී අලුතින් වනාන්තර වැවීම සහ නැවත වන වගා සඳහා යන පිරිවැය සහ ඒවා ස්ථාපිත කිරීමෙන් පසු පොහොර යෙදීම , ආරක්ෂාව සැලසීම ඇතුලු නඩත්තු කටයුතු සඳහා යන පිරිවැය සලකා බැලේ.

4 ජෛව ස්කන්ධ නිදහස් කිරීම - දහනය කැපීම සහ වන නිෂ්පාදන සංචායකයන්

මෙයින් අදහස් වනුයේ ජෛව ස්කන්ධ(ශාක) දැව නිෂ්පාදන සඳහා හෝ ජෛව ඉන්ධන සඳහා පරිවර්තනය කරන්නේද නැතහොත් වනය තුල එලෙසින්ම ස්ථිර වශයෙන්ම පැවතීමට ඉඩ හරින්නේද යන්නයි.

5 උචිත මිල

මූල්‍යය/මිල පිළිබඳ උපකල්පනයක් කාබන් තිර කිරීමේ පිරිවැය කෙරෙහි විශාල බලපෑමක් ඇති කරයි. මේ සඳහා ප්‍රධාන වශයෙන් කරුණු 3 ක් සලකා බලයි.

- වන නිෂ්පාදන සහ කෘෂි නිෂ්පාදන වල මිල.
- කාබන් ගණන් බැලීම පිළිබඳ වෙනස් ක්‍රමවේදවල ඇති බලපෑම.
- විකල්ප වට්ටම් අනුපාත වල ප්‍රතිඵල.

6 කාබන් තිර කිරීම මුදුන් පමුණුවා ගැනීම සඳහා භාවිතා කල ප්‍රතිපත්ති මෙවලම

ප්‍රතිපත්ති සම්පාදකයන් විසින් වනාන්තර වල කාබන් තිරකිරීම උත්තේජනය වැඩි කිරීම සඳහා විවිධ වූ මාර්ග වලින් උත්සාහ දරයි. රජය විසින් පුද්ගලික ඉඩම් හිමියන් සඳහා කාබන් සංචිත වැඩි කර ගැනීමට යොදාගත හැකි ක්‍රමයෙන් භාවිතා කිරීම සඳහා සහනාධාර ලබාදීම සිදුකල හැක. විකල්ප ලෙස එලෙස අනුකූල නොවන්නා වූ භූමි භාවිතයන් හෝ ක්‍රියාකාරකම් සඳහා රජය විසින් බදු පැනවීම සිදුකල හැක. තවද කාබන් වෙළඳම් ක්‍රම ස්ථාපනය කල හැකි අතර පුද්ගලික ඉඩම් වල කටයුතු නීත්‍යානුකූල කල හැකිය. මේවාට අමතරව රජයට තමන්ගේ වගා පොදු භූමි ප්‍රදේශවල ද සිදුකල හැක.

මෙවැනි කාබන් තිර කිරීමේ පිරිවැයන් ගණනය කිරීමට තරම් අප රටේ ඒ සඳහා අවශ්‍ය ඉහත දත්තයන් ලබා ගැනීම සඳහා අවශ්‍ය අධ්‍යයනයන් සිදුකර නොමැත. ඒ සඳහා ද ඉතා අධික පිරිවැයක් දැරීමට සිදුවේ. දැනට ශ්‍රී ලංකාවේ වනාන්තර වල ඇති ශාක විශේෂ වලින් තිර කරන කාබන් ප්‍රමාණය හෝ නිර්ණය කිරීම සඳහා පර්යේෂණ අධ්‍යයනයන් සිදුකිරීම කාලීන අවශ්‍යතාවයකි.

කෙසේ වුවද මෙවැනි අධ්‍යයනයන් සහ ඒවා පිළිබඳ තොරතුරු කියෝතෝ සන්ධානය යටතේ ක්‍රියාත්මක වන පවිත්‍රතා සංවර්ධන යාන්ත්‍රණයේ ( Clean Development Mechanism) ප්‍රතිලාභ ලබා ගැනීම සඳහා අප රටට ද ඇති අවස්ථාවන් වැඩි කර ගැනීමට ඉවහල් වනු ඇත.

මූලාශ්‍රය: The cost of U.S. Forest Carbon Sequestration PEW CENTER on Global Climate Change.

සම්පත් අරවින්ද රණසිංහ
වැඩසටහන් සහකාර (පරිසර )
පරිසර ආර්ථික හා ගෝලීය කටයුතු අංශය

